# ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2022 / 2023

### SLQF Level 8

## අයදුම්පත් කැඳවීම (සිංහල මාධ්‍යය)

ජාතික අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන සම්භාර 36 කින් සමන්විත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලවේ 2022 / 2023 අධ්‍යයන වර්ෂය සඳහා සිංහල මාධ්‍ය පාඨමාලාලාභීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0 අවශ්‍ය සුදුසුකම්**

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව විසින් පිළිගත් වෙනත් රටක පුරවැසියෙක් වීම.

(II) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධියක් (අවම වශයෙන් කාලය අවුරුදු 03 ක) ලබා සිටීම.

(III) ශ්‍රී ලංකා ගුරු සේවය / ශ්‍රී ලංකා විදුහල්පති සේවය / ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය / ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට ඇතුළත් රජයේ හෝ අර්ධ රාජ්‍ය පාසලක / පිරිවෙනක / රජය අනුමත වෙනත් ආගමික අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වීම.

(IV) ස්ථිර හා අඛණ්ඩ සේවයේ නියුතු වීම හෝ

(V) ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්

2.0 මෙම පාඨමාලාව සති අන්ත සහ පාසල් නිවාඩු කාලවල දී පවත්වනු ලබන අර්ධ කාලීන මාස 18 ක පාඨමාලාවකි. එසේම මාර්ගගත හා සම්මුඛ සැසි මගින් අධ්‍යයන කටයුතු සිදු කෙරෙන අතර මෙම පාඨමාලාව ප්‍රාදේශීය මධ්‍යස්ථාන හරහා සිදු කෙරේ.

3.0 **පාඨමාලාවට තෝරා ගැනීම**

ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඉන් සුදුසුකම් ලැබූවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් හෝ සම්මුඛ පරීක්ෂණය මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

4.0 සුදුසුකම් ලැබූ පාඨමාලාලාභීන් අවම වශයෙන් පනස්දෙනෙකුවත් නොමැති මධ්‍යස්ථානවල පාඨමාලාව පවත්වනු නොලැබේ. එවැනි මධ්‍යස්ථානයක් ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට තම මනාපය පරිදි වෙනත් මධ්‍යස්ථානයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත. (මේ පිළිබඳ අවසාන තීරණය අධ්‍යක්ෂ ජනරාල් සතුය)

5.0 **පාඨමාලා ගාස්තු**

අයදුම් කිරීමේ ගාස්තුව රු. 1,500/- කි. ලියාපදිංචි ගාස්තුව රු. 2,000/- කි. පාඨමාලා ගාස්තුව රු. 80,000/- කි. පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ ලියාපදිංචි ගාස්තුව හා පළමු වාරිකය ගෙවිය යුතුය. (ලියාපදිංචි ගාස්තුව රු. 2,000/-, පළමු වාරිකය රු. 50,000/-). ඉහත ගාස්තුවට අමතරව අවසාන විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව ද ගෙවිය යුතුය.

**පාඨමාලාව පැවැත්වෙන ප්‍රාදේශීය මධ්‍යස්ථාන**

| අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය | අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
|---|---|---|---|
| 01 | මහරගම (ජාතික අධ්‍යාපන ආයතනය) | 16 | මොනරාගල (රාජකීය විද්‍යාලය) |
| 02 | ගම්පහ (කැප්පෙටිපොල ම.වි.) | 17 | බිබිල (යශෝදරා බා.වි.) |
| 03 | කළුතර (කළුතර ම.වි.) | 18 | කැකිරාව (කැකිරාව ම.ම.වි) |
| 04 | ඇඹිලිපිටිය (ඇඹිලිපිටිය ම.වි.) | 19 | පොළොන්නරුව (පලුගස්දමන ම.වි) |
| 05 | රත්නපුරය (සුමන බා.වි.) | 20 | අනුරාධපුරය (මධ්‍යය විද්‍යාලය) |
| 06 | කෑගල්ල (ශා/ජෝශප් බා.වි.) | 21 | නිකවැරටිය (මහසෙන් විද්‍යාලය) |
| 07 | බලංගොඩ (විද්‍යාලෝක ම.වි.) | 22 | හලාවත (මාදම්පේ සේනානායක ම.වි) |
| 08 | මාතලේ (සිරිමාවෝ බණ්ඩාරනායක ජා.පා) | 23 | කුරුණෑගල (මලියදේව පි.වි) |
| 09 | මහනුවර (ස්වර්ණමාලි බා.වි.) | 24 | කුලියාපිටිය (සාරාණාත් ම.වි) |
| 10 | පේරාදෙණිය (ශ්‍රී පුෂ්පදාන ම.වි.) | 25 | අම්පාර (කාවන්තිස්ස ම.වි) |
| 11 | නුවරඑළිය (ගාමිණී ම.වි.) | 26 | තංගල්ල (තංගල්ල බා.වි) |
| 12 | බදුල්ල (ධර්මදූත විද්‍යාලය) | 27 | මාතර (මහාමායා බා.වි) |
| 13 | බණ්ඩාරවෙල (බණ්ඩාරවෙල ගුරු මධ්‍යස්ථානය) | 28 | ගාල්ල (රුහුණු ජා.අ.වි.පී) |
| 14 | මහියංගනය (මහියංගනය ජා.පා.) | 29 | හම්බන්තොට (සහිරා විද්‍යාලය) |
| 15 | කන්තලේ (කන්තලේ ම.ම.වි.) | | |

7.0 **අයදුම් කරන පිළිවෙළ**

(අ) මෙහි සඳහන් ආදර්ශ අයදුම්පතයට අනුව A 4 ප්‍රමාණයේ තනි පිටුවක අයදුම්පතක් සකස් කර, ඒ සමග ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 ට රු. 1,500/- ක මුදලක් බැරකර ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත සහ නම හා ලිපිනය ලියූ රු. 50/- ක් වටිනා මුද්දර ඇලවූ 9' x 4' ප්‍රමාණයේ ලියුම් කවරයක් 2022.09.21 දිනට පෙර **අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම,** 10280 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මුදල් ගෙවීමේ දී මුදල් ඇණවුම් හෝ ලංකා බැංකුව හැර වෙනත් බැංකුවකට බැර කරන ලද මුදල් හෝ භාර ගනු නොලැබේ.

(ආ) තැපැල් මාර්ගයෙන් එවනු ලබන අයදුම්පතට අමතරව WWW.NIE.LK යන වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය ඔස්සේ ද යොමු කිරීම අනිවාර්ය වේ. (Google form)

(ඇ) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පත, ප්‍රථමඋපාධි සහතිකය හා පත්වීම් ලිපිය යන ලේඛනවල ඡායා පිටපත් (A4 ප්‍රමාණයේ) අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. (ඉහත සඳහන් ලේඛන හැර වෙනත් කිසිදු ලේඛන නො එවිය යුතුයි)

(ඉ) 2022.09.21 දිනට පසුව ලැබෙන අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.0 තෝරාගනු ලබන පාඨමාලාලාභීන් විසින් අධ්‍යයන කාල සීමාව තුළ ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුව සඳහා සති 10 ක කාලයක් පාසලක ඉගැන්වීමේ කාර්යයේ නිරත විය යුතුය. පාසලක ඉගැන්වීමේ කාර්යයේ නිරත නොවන අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් මේ සඳහා සුදුසු පාසලක් තෝරාගත යුතුයි.

9.0 ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "PGDE 2022/S" යනුවෙන් සඳහන් කළ යුතුය. ආදර්ශ අයදුම්පත සහ වැඩිදුර විස්තර www.nie.lk සහ Channel NIE (You Tube) වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.

කර්යාල දිනයන්හි පස්වරු 01.00 සිට 03.00 දක්වා දුරකථන අංක 0117-601745 ඇමතීමෙන් ද විස්තර ලබාගත හැකිය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

Office Use Only :

**National Institute of Education - Department of Teacher Education**
**Maharagama**
**Application for the enrolment in Postgraduate Diploma in Education programme -2022/2023**
(Please complete in ENGLISH CAPITAL LETTERS only)

Rev./ Mr./ Mrs./ Miss.

1. **Name with Initials**
2. **Full Name**
3. **Address (Residence)**
4. **NIC Number**
5. **Address (Work) Official**
6. **Designation**
7. **Gender**
8. **Date of Birth** D D M M Y Y Y Y Y Y
9. **Preferred Centre** 1. 2.
10. **Preferred Medium**
11. **Name of the first Degree**
(Please attach certified copy of degree certificate)
12. **University / Institution**
13. **Date of first appointment** D D M M Y Y Y Y Y (Please attach certified copy of appointment letter)
14. **Contact No.** WhatsApp No.

"I declare that all the above information is correct and true to the best of my knowledge and the Institute shall be entitled to declare the contract void and cancel my application if I have made any misrepresentation or omission on this application".

Signature of Applicant____________________ Date:__________

Recommendation of the Principal / Head of the Department

I recommend and forward the application of Rev/ Mr/ Ms. ……………………………………

Signature :………………… Date:…………………… (Official stamp)

Recommendation of the Zonal Director of Education (For SLPS/ISA/SLTS only)

I recommend and forward the application of Rev/ Mr/ Ms. ……………………………………

Signature :………………… Date:…………………… (Official stamp)